ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දීය වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සංසදය (FICCI) ඉන්දීය සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අවස්ථා පිළිබඳ වීඩියෝ සම්මන්ත්‍රණයක් සංවිධානය කරයි</u>**

ඉන්දීය වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සංසදය විසින් අද දින ඉන්දීය සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ පශ්චාත් වසංගත ආර්ථික තත්වය තුළ පවතින ව්‍යාපාර අවස්ථා පිළිබඳ වීඩියෝ සම්මන්ත්‍රණයක් සංවිධානය කර තිබිණ.

මෙහිදී ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශ ප්‍රධානී සුජා කේ. මෙනන් මහත්මිය ඉන්දියා-ශ්‍රී ලංකා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ පැහැදිලි කළාය. ඉන්දියා-ශ්‍රී ලංකා සම්බන්ධතාවය නිරන්තර සමුළු මට්ටමේ හමුවීම් සහ සියලු තරාතිරමේ සමීප සබඳතා වලින් සමන්විත බව ඇය පෙන්වා දුන්නාය.

ලෝක බැංකුව විසින් වර්ගීකරණය කර ඇති පරිදි ශ්‍රී ලංකාව පසුගිය වසරේදී ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වූ බව මෙනන් මහත්මිය සඳහන් කළ අතර ශ්‍රී ලංකාවේ සමාජ දර්ශකද සතුටුදායි මට්ටමක පවතින බව පෙන්වා දුන්නාය. කොවිඩ්-19 අර්බුදය විසින් ලොව පුරා මතු කර ඇති ආර්ථික දුෂ්කරතා ජයගැනීමට සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතු බව ඇය ප්‍රකාශ කළාය. දශක ගණනාවක සිට ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතුවල නිරත ඇතැම් ඉන්දීය සමාගම් ආයෝජන, තාක්ෂණය හා කුසලතා රැගෙන එමින්, දේශීය රැකියා අවස්ථා බිහිකරමින් ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල ශක්තියක් වී ඇති බව ඇය සඳහන් කළාය. එසේම ශ්‍රී ලාංකික සමාගම් රැසක්ද ඉන්දීය වෙළෙඳපොළ තුළ සාර්ථකව ව්‍යාපාර කටයුතු සිදු කරන බව ඇය පෙන්වා දුන්නාය. පවතින සහයෝගීතාවයන් ශක්තිමත් කරමින් එක්ව කටයුතු කළ හැකි නව අවස්ථාවන් පිළිබඳ උනන්දු වන ලෙස ඇය ඉන්දීය සමාගම් දිරිමත් කළාය.

FICCI හි නියෝජිතයන්ට අමතරව ඉන්දීය සමාගම් රැසක්ද මෙම වීඩියෝ සමුළුවට එක් විය.

කොළඹ

2020 මැයි 5

* * * * *